# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2243/20 - 2021 සැප්තැම්බර් මස 04 වැනි සෙනසුරාදා - 2021.09.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 9/2016(II).

**2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත**

2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 142 වන වගන්තිය යටතේ සෞඛ්‍ය අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

ආචාර්ය කෙහෙළිය රඹුක්වැල්ල,
සෞඛ්‍ය අමාත්‍ය.

2021 සැප්තැම්බර් මස 04 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

1\. මෙම නියෝග 2021 අංක 1 දරන වෛද්‍ය (වෛද්‍ය උපකරණ මිල නියම කිරීම) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2\. (1) යම් තැනැත්තකු විසින් මෙහි උපලේඛනයෙහි I වන තීරුවෙහි නිශ්චිතව සඳහන් යම් වෛද්‍ය උපකරණයක් එකී උපලේඛනයේ II වන තීරුවේ අනුරූපී සටහනේ නිශ්චිතව දක්වා ඇති මිලට වඩා වැඩි මිලකට විකිණීම හෝ ඒ සඳහා අයකිරීම සිදු නොකළ යුතු ය.

(2) උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති මිල එකී උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව සඳහන් වෛද්‍ය උපකරණය සඳහා උපරිම සිල්ලර මිල විය යුතු ය:

එසේ වුව ද, ජාත්‍යන්තර සැසඳුම් මිල ගණන් සහ වෙනත් සාධක අනුව උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයේ මෙම නියෝග පළ කරනු ලැබූ දින පවත්නා වෙළඳපල මිල එකී උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිලට වඩා අඩුවන විට දී, එම වෛද්‍ය උපකරණය, කිසිදු මිල වැඩි කිරීමකින් තොරව, මෙම නියෝග පළ කරනු ලැබූ දින පවත්නා වෙළඳපොල මිලට විකුණනු ලැබිය යුතු ය.

1A - G 34546 — 25 (2021/09)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. ආනයනකරු හෝ නිෂ්පාදකයා විසින්, උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයේ වෙළඳ ඇසුරුමේ හෝ ඒකකයක ලේබලය මත එම උපලේඛනයේ II වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති උපරිම සිල්ලර මිල මැකිය නොහැකි තීන්ත වර්ගයකින් පැහැදිලිව මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.

4. 3 වන නියෝගයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ නියෝග පළකරනු ලැබූ දින සිට මාස තුනක කාල සීමාවක් ඇතුළත, ආනයනකරු හෝ නිෂ්පාදකයා විසින්, උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක පවත්නා තොගයේ වෙළෙඳ ඇසුරුමේ හෝ ඒකකයක ලේබලය මත උපරිම සිල්ලර මිල මුද්‍රණය හෝ සලකුණු කරනු ලැබිය යුතු ය.

5. උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් විකුණනු ලබන හෝ එවැනි වෛද්‍ය උපකරණයක් සඳහා අයකිරීමක් කරනු ලබන යම් තැනැත්තකු විසින් වෙනම අයිතමයක් ලෙස එම වෛද්‍ය උපකරණයේ වෙළඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය, ඇසුරුමේ ප්‍රමාණය සහ මිල පැහැදිලිව පෙන්නුම් කරනු ලබන ලදුපතක් නිකුත් කරනු ලැබිය යුතු ය.

6. උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති යම් වෛද්‍ය උපකරණයක් විකුණනු ලබන හෝ එවැනි වෛද්‍ය උපකරණයක් සඳහා අය කිරීමක් කරනු ලබන සෑම තැනැත්තකු විසින් ම එම වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල පැහැදිලිව පෙනෙන ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු ය.

7. උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයට සමාන යම් වෛද්‍ය උපකරණයක වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සඳහා වන උපරිම සිල්ලර මිලක් එම උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැතිවිට දී, එම වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල එම උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති වෛද්‍ය උපකරණයේ උපරිම සිල්ලර මිල විය යුතු ය.

8. යම් වෛද්‍ය උපකරණයක වෙළෙඳ නාමය සහිත හෝ රහිත අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය උපලේඛනයේ නිශ්චිතව දක්වා නොමැති විට දී, එසේ නිශ්චිතව දක්වා නොමැති වෛද්‍ය උපකරණයේ වෙළඳ හෝ අනුමත නාමය, මාදිලිය, වර්ගය, ප්‍රමාණය හෝ ඇසුරුමේ ප්‍රමාණය සඳහා වන උපරිම සිල්ලර මිල 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වන වගන්තිය යටතේ නිශ්චය කරන ලද හඳුන්වා දීමේ මිල විය යුතු ය.

9. මෙම නියෝගයන්හි විධිවිධාන උල්ලංඝනය කරනු ලබන යම් තැනැත්තකු විසින් වරදක් සිදුකරනු ලබන්නේ ය.

10. මේ නියෝගවල-

"තැනැත්තා" යන්නට, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ යම් පුද්ගල මණ්ඩලයක් ඇතුළත් වේ.

**උපලේඛනය**

(2 වන නියෝගය).

| *අංකය* | *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|---|
| | *වෛද්‍ය උපකරණයේ අනුමත නාමය* | *ඒකකයක උපරිම සිල්ලර මිල (MRP)<br>(ශ්‍රී ලංකා රුපියල්)* |
| 1 | ෆින්ගර් ටිප් පල්ස් ඔක්සිමීටරය (Fingertip Pulse Oximeter) | 3,000.00 |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.